*සැ. යු.-* 2018.04.06 දින පළ වූ අංක 2,066 දරන *ගැසට් පත්‍රයේ* III කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,067 - 2018 අප්‍රේල් මස 12 වැනි බ්‍රහස්පතින්දා - 2018.04.12**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)



| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම ... ... ... | 232 |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |



**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2018 මැයි මස 04 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2018 අප්‍රේල් මස 20 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*.

2018 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය www. documents.gov. lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පිස්කල් විකිණීම්

## පිස්කල් වෙන්දේසියේ විකිණීමයි

## කුලියාපිටිය දිසා අධිකරණයේ දීය

මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී,

නඩු අංකය : 1550/උකස්
ඇස්කිසි අංකය : 67/16

පෙර,
එම්.සී.එස්.එල්. ෆිනෑන්ෂියල් සර්විසස් ලිමිටඩ්,
සහ මර්චන්ට් ක්‍රෙඩිට් ඔෆ් ලංකා ලිමිටඩ්,
බැන්ක් ඔෆ් සීලෝන් මර්චන්ට් ටවර්,
අංක 28, ශාන්ත මයිකල් පාර,
කොළඹ 3.

...............................*පැමිණිලිකරු.*

*එදිරිව*

රාජකරුණා වෙඩික්කාර පණ්ඩිත නයිදෙලාගේ ප්‍රියන්ත රාජකරුණා,
අංක 298, පහල රුක්මලේ, නාරම්මල.

....................................*විත්තිකරු.*

වර්ෂ 2015 ක් වූ ජුනි මස 22 වැනි දින ඇතුළත් කරන ලද තීන්දු ප්‍රකාශය ප්‍රකාර ඉහත කී විත්තිකරු විසින් පැමිණිලිකරු හට කාලීන ණය අංක KUCRTL0900249700 ගෙවිය යුතු රුපියල් එක්කෝටි හැටපන්ලක්ෂ පනස් හත්දහස් හාරසිය තුනයි ශත හතලිහක (රු. 16,557,403.40) මුදලක් අයකර ගැනීම සඳහා එකී නඩුවෙන් මා වෙත නිකුත් කර ඇති විකිණීමේ නියෝගයේ බලය පිට මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති ඉහත නම් සඳහන් විත්තිකරුට අයත් නිශ්චල දේපල,

වර්ෂ 2018 ක් වූ මැයි මස 11 වැනි දින පෙරවරු 10.30 ට එකී දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

ඉහත කී උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දඹදෙණි හත්පත්තුවේ, උඩුකහ උතුරු කෝරළේ, නාරම්මල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නාරම්මල ප්‍රාදේශීය සභාවට අයත් අංක 1064 රන්මුතුගල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ රන්මුතුගල ගමේ පිහිටි නිටුහුල්ලගහකුඹුර *හෙවත්* පොතුකුඹුර *හෙවත්* පරගව කුඹුර දැනට වත්ත නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. එම්. ඒ. යාපා මහතා විසින් මැන සාදන ලද අංක 646 සහ 1981.01.25 දින දරන පිඹුරේ ප්‍රකාර මායිම්,

| | | |
|---|---|---|
| උතුරට | : | හේරත් බණ්ඩාට අයත් ඉඩම ද, |
| නැගෙනහිරට | : | ගිරිඋල්ල සිට නාරම්මල දක්වා ප්‍රධාන පාර ද, |
| දකුණට | : | මැදගොඩ පාර ද, |
| බස්නාහිරට | : | සෝමරත්න මහතාට අයත් පොල් ඉඩම ද, |

යන මායිම් තුළ පිහිටි පර්චස් දහනවයයි දශම හයයි දෙකයි පහක් (අ.00, රූ.00, පර්.19.625) විශාල ඉඩම සහ ඊට අයත් ගහකොළ, පළතුරු යනාදී සියලු දේත් සමග වේ.

මෙම ඉඩම කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ F 1368/95 හි ලියාපදිංචි වී ඇත.

*දේපල පිහිටීම.-*

ගිරිඋල්ල හයිවේ මාර්ගයේ නාරම්මල සිට මීටර් 850 ක දුරක් ගියවිට වම්පස ඇති 1/5 බෝක්කුව පසුකරන විට දකුණුපස ඇති මැදගොඩට යන කාපට් පාර සහ ප්‍රධාන පාරට ඇතරමැදිව මෙම ඉඩම් කොටස පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.-*

වෙන්දේසිය අවසන් වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් ගැණුම් මිලෙන් 25% ක්ද සිවිල් නඩු විධාන සංග්‍රහයේ අංක 258 ප්‍රකාරව රජයේ ගාස්තු ද වෙන්දේසිකරුගේ කොමිස් මුදල ලෙස විකුණුම් මිලෙන් 2 1/2% ක මුදලක්ද ලිපිකරු හා ගෝෂකගේ ගාස්තු ද සියලුම විකුණුම් වියදම් ද විකුණුම් සහතිකය සඳහා මුද්දර හා නොතාරිස් ගාස්තුවද එවෙලේම මුදලින් ගෙවිය යුතු ය.

වතව ද, ගැණුම් මිලෙන් ඉතිරි 75% ක් වූ මුදල විකුණුම් දින සිට දින තිහක් (30) ඇතුළත ඉහත අංක දරන නඩුවේ බැරට අධිකරණයේ තැන්පත් කළ යුතු ය.

*නිමිකම් ඔප්පු හා වැඩි විස්තර සඳහා :*

කළමණාකරු - නීති, මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී,
කොළඹ 3, ශාන්ත මයිකල් පාරේ, අංක 28 දරන ස්ථානයේ, ලංකා බැංකු මර්චන්ට් කුලුනේ, 17 වන මහල.

දුරකථන අංකය : 011 - 4711711
ෆැක්ස් : 011 - 4711743/759
ඊමේල් : mbslbank@mbslbank.com

රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය - කුලියාපිටිය.

04-513

---

# විවිධ දැන්වීම්

## නව පැනසොමා ෆ්‍රෙන්ඩ්ෂිප් ෆෞන්ඩේෂන් සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

කේ. කාදර් මස්තාන් වන මම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ අංක 48(1) දරන ස්ථාවර නියෝගය යටතේ ''නව පැනසොමා ෆ්‍රෙන්ඩ්ෂිප් ෆෞන්ඩේෂන් සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි'' යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණු වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්ත වන්නා වූ එකී පදනම සංස්ථාගත කිරීමයි :-

*(අ)* උපකරණ භාවිතය සඳහා අවශ්‍ය තැන්වල කෘෂි උපකරණ සපයා දී තරුණ ගොවියා කෘෂි කර්මාන්තයට නැඹුරු කිරීම තුළින් ලංකාවේ ආර්ථික බෝග නිෂ්පාදන ධාරිතාව වැඩි කිරීම හා කාර්යක්ෂම කිරීම,

*(ආ)* ශ්‍රී ලංකාවේ කෘෂිකර්ම ගුරුවරුන්ට ජපානයේ කෘෂිකර්මාන්තය පිළිබඳව කෙටි කාලීන පුහුණුවක් ලබා දීමෙන් අනතුරුව අදාළ පාසල් වල කෘෂි ආදර්ශ ඇති කිරීමට අවශ්‍ය උපකරණ හා සේවා සැපයීම සම්බන්ධයෙන් කටයුතු කිරීම,

*(ඇ)* බඩ ඉරිඟු (Maize) ආශ්‍රිත කෘෂි නිෂ්පාදන වර්ධනය කිරීමට කටයුතු කිරීම හා සෙසු ධාන්‍ය වර්ග වගා කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා උපකාර කිරීම, අනුබල දීම,

යනාදිය වේ.

කේ. කාදර් මස්තාන්,
පාර්ලිමේන්තු මන්ත්‍රී,
වන්නි දිස්ත්‍රික්කය.

04-426

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.